# වගකීම් දැරීමේ යාන්ත්‍රණය

## ප්‍රතිපත්ති විමසුම 2010

වැඩි විස්තර සඳහා www.adb.org/AM-REVIEW/ වෙත පිවිසෙන්න.

### ආසියානු සංවර්ධන බැංකුවේ වගකීම් දැරීමේ යාන්ත්‍රණය යනු කුමක් ද?

ආසියානු සංවර්ධන බැංකුව 2003 මැයි මාසයේ දී කලින් පැවති 1955 පරීක්ෂණ කෘත්‍යය වෙනුවට නව වගකීම් දැරීමේ යාන්ත්‍රණයක් අනුමත කළේ ය. මෙම යාන්ත්‍රණය ස්ථාපිත කරන ලද්දේ ආසියානු සංවර්ධන බැංකුව විසින් ආධාර කරන ලද ව්‍යාපෘති මගින් අහිතකර බලපෑම්වලට පාත්‍ර වූ ජනයාට ඔවුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් හඬ නැගීමට හා විසඳුම් සොයා ගැනීමටත් ආසියානු සංවර්ධන බැංකුවේ මෙහෙයුම් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සම්බන්ධ චෝදිත උල්ලංඝනයන් වාර්තා කිරීම පිළිබඳවත් වඩා හොඳ ප්‍රවේශයක් ලබා දීම සඳහා ය.

එසේ ම යාන්ත්‍රණය ස්ථාපනය කිරීම යනු ආසියානු සංවර්ධන බැංකුවේ සංවර්ධන සඵලදායකත්වය, ව්‍යාපෘති ගුණාත්මකභාවය හා මෙහෙයුම්වල විනිවිදභාවය නංවාලීම පිණිස දරණ ලද උත්සාහයක් ද වේ.

යාන්ත්‍රණයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ එහි එකිනෙක හා සම්බන්ධ *විචාරණ හා අනුකූලතා සමාලෝචනය* යන දෙයාකාර කෘත්‍යයන් (consultation and compliance review) ය. පළමු පියවර ගැටළු නිරාකරණය ඉලක්ක කර ගනිමින් හවුල්කාර පාර්ශවයන් විමසීම ය. සතුටුදායක විසඳුමකට එළඹීමට නොහැකි නම්, විචාරණය සඳහා පැමිණිල්ලක් ගොනු කිරීම යෝග්‍ය නොවන බව පෙනේ නම් හෝ විචාරණ ක්‍රියාවලිය ඉහළ අවධියක් කරා එළඹී තිබේ නම් හා ආසියානු සංවර්ධන බැංකුවේ මෙහෙයුම් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සම්බන්ධ අනුකූලතාව පිළිබඳ ප්‍රශ්නයක් පවතී නම් හෝ අනුකූලතා සමාලෝචනයක් ඉල්ලා සිටිය හැකි ය. මෙම අදියර සම්බන්ධයෙන් වගකීම දරනුයේ අනුකූලතා සමාලෝචන මණ්ඩලය යි. මණ්ඩලයේ 43 වෙනි වාර්ෂික රැස්වීමේ දී ආසියානු සංවර්ධන බැංකුවේ සභාපතිවරයා ආසියානු සංවර්ධන බැංකුව එහි වගකීම් දැරීමේ යාන්ත්‍රණය පිළිබඳව ඒකාබද්ධ මණ්ඩල කළමනාකරණ විචාරණයක් පවත්වනු ලබනු ඇති බව ප්‍රකාශයට පත් කළේ ය.

### වගකීම් දැරීමේ යාන්ත්‍රණය පිළිබඳ ප්‍රතිපත්ති සමාලෝචනය

**පසුබිම.** 2010 මැයි මාසයේ ටෂ්කෙන්ට් හි පැවති ආසියානු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ 43 වෙනි වාර්ෂික රැස්වීමේ දී ආසියානු සංවර්ධන බැංකුවේ සභාපතිවරයා ආසියානු සංවර්ධන බැංකුව එහි වගකීම් දැරීමේ යාන්ත්‍රණය පිළිබඳව ඒකාබද්ධ මණ්ඩල කළමනාකරණ විචාරණයක් පවත්වනු ලබනු ඇති බව ප්‍රකාශයට පත් කළේ ය.

සමාලෝචනය පැවත් වීම සඳහා ස්ථාපනය කරනු ලැබ තිබෙන ඒකාබද්ධ මණ්ඩල හා කළමනාකරණ වැඩ කණ්ඩායම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හතර දෙනෙකුගෙන් ද කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල්ගෙන් ද සමන්විත වෙයි. ජාත්‍යන්තර බාහිර විශේෂඥයන් දෙදෙනෙකු වන ආචාර්ය ඉෂ්රාට් හුසේන් හා ආචාර්ය මාර්ට් ජේ වැන් පුටන් මෙම සමාලෝචයේ දී සහාය ලබා දීමෙහි නිරතව තිබේ. සමාලෝචනයට මහජන විචාරණ ක්‍රියාවලියක්, හවුල්කාර පාර්ශවයන් සමග මුහුණට මුහුණලා සාකච්ඡාවලට සම්බන්ධ වීම හා වගකීම් දැරීමේ යාන්ත්‍රණය පිළිබඳ වෙන් කරන ලද වෙබ් අඩවියක් ඔස්සේ මහජනතාවගෙන් ගුණ දොස් ලබා ගැනීම අඩංගු වේ. ක්‍රමෝපාය හා ප්‍රතිපත්ති පිළිබඳ දෙපාර්තමේන්තුව වැඩ කණ්ඩායම සඳහා ලේකම් කාර්යාංශ සේවා සපයනු ලැබේ.

සමාලෝචනය පිළිබඳ වැඩිමනත් තොරතුරු වගකීම් දැරීමේ යාන්ත්‍රණය පිළිබඳ වෙබ් අඩවිය වන http://www.adb.org/AM-Review/ හි අඩංගු වේ.

**අරමුණු සහ ගැටළු.** වගකීම් දැරීමේ යාන්ත්‍රණයෙහි වැඩි දියුණු කිරීම් සඳහා වන විෂය පථය විමර්ශනය කිරීම සමාලෝචනයේ අරමුණ වනු ඇත. සමාලෝචනය පුළුල් පදනමකින් යුක්ත වන අතර අනෙක් ඒවා අතර පහතින් එන අංග ඇතුළත් කර ගනු ඇත.

1. එහි ඓතිහාසික පර්යාවලෝකයේ, අරමුණුවල හා 2003 ප්‍රතිපත්තියෙහි සංකල්පීයගත කර ඇති පරිදි මූලධර්මවල ආලෝකය තුළින් වගකීම් දැරීමේ යාන්ත්‍රණයේ සඵලදායීතාව හා යෝග්‍යතාව පිළිබඳ විශ්ලේෂණය.
2. විශේෂයෙන්ම 2020 ක්‍රමෝපාය අනුමත කිරීම ඇතුළු ආසියානු සංවර්ධන බැංකු මෙහෙයුම් පිළිබඳ වෙනස්වන සන්දර්භය පිළිබිඹු කරමින් 2003 සිට වගකීම් දැරීමේ යාන්ත්‍රණය හා සම්බන්ධ ආසියානු සංවර්ධන බැංකුවේ අත්දැකීම් පිළිබඳව අගැයීම.
3. අනෙකුත් අදාළ සංසදකයන් සමග ආසියානු සංවර්ධන බැංකුවේ වගකීම් දැරීමේ යාන්ත්‍රණය පිළිබඳ සංසන්දනය හා විශ්ලේෂණය.
4. මහ ජනතාව, ව්‍යාපෘතියෙන් පීඩාවට පත් ජන සමූහ, පාලනය, ආසියානු සංවර්ධන බැංකු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, කළමනාකරණය, මෙහෙයුම් කාර්ය මණ්ඩලය, රාජ්‍ය නොවන හා සිවිල් සමාජ සංවිධාන ඇතුළු හවුල්කරුවන් සමග විචාරණය.
5. විශ්ලේෂණය, සංසන්දනය, අගැයීම හා විචාරණයෙන් පැන නගින ප්‍රධාන ප්‍රශ්න පිළිබඳව ආමන්ත්‍රණය කිරීම. පහතින් ලැයිස්තුගත කර ඇති පරිදි විවිධ හවුල්කරුවන් විසින් මතු කරනු ලැබ තිබෙන ඇතැම් ප්‍රශ්න මෙසේ ය.
   - **i.** වත්මන් වගකීම් දැරීමේ යාන්ත්‍රණය යටතේ ස්ථාන සංචාරවලට පිවිසුම අවශ්‍ය කෙරේ. ස්ථාන සංචාර සඳහා ණය ගන්නා රටේ අවසරය ලබා ගැනීම අවශ්‍ය කෙරේ.
   - **ii.** අනුකූලතා සමාලෝචන අදියර සම්බන්ධ සාපේක්ෂ වශයෙන් වන සීමිත වගකීම.
   - **iii.** වාර්තාකරණ මාර්ග, හිමිකම හා වගකීම් දැරීමේ යාන්ත්‍රණ වාර්තා හා ලියකියවිලි ආදිය බෙදා හැරීම; එසේ ම අයවැය සැකසීම, කාර්ය මණ්ඩල සැකසීම, ස්වාධීන නීති උපදෙස් සඳහා ප්‍රවේශ වීම හා විශේෂඥයන් හා උපදේශකයන් නිරත කිරීමේ අයිතිය ඇතුළු යාන්ත්‍රණයේ ස්වාධීනත්වයේ මට්ටම.
   - **iv.** පීඩාවට පත් ජනතාවට යාන්ත්‍රණයට ප්‍රවේශවීමේ හැකියාව.
   - **v.** පැමිණිල්ලක් ගොනු කිරීම සඳහා යෝග්‍යතා නිර්ණායකය.
   - **vi.** අනුකූලතා සමාලෝචන මණ්ඩල කාර්යාලයේ (OCRP) හා ආසියානු සංවර්ධන බැංකුවේ තොරතුරු බෙදා හැරීමේ ද මහජන කැපවීමේ හා බලපෑමේ (ආසියානු සංවර්ධන බැංකුවේ වගකීම් දැරීමේ මට්ටම පිළිබඳ දැනුවත් භාවයේ) ද සඵලදායීතාව.

ADB Asian Development Bank

**vii.** අවශ්‍ය කාලය, ප්‍රමාදවීම් හා මූල්‍ය වැයවල වැඩි වීම්වලට අනුකූලවන සේ ව්‍යාපෘති ගෙන ඒමෙන් ඇති වන ගම්‍යමානයන් පිළිබඳ තක්සේරු කිරීම.

**viii.** සංවර්ධනය වන සාමාජික රටවල (DMCs) විශේෂිත ඕනෑ එපාකම් සැලකිල්ලට ගනිමින් තීරණ ගැනීමේ හා ව්‍යාපෘති තෝරා ගැනීමේ ආසියානු සංවර්ධන බැංකු ප්‍රවේශය කෙරෙහි වගකීම් දැරීමේ යාන්ත්‍රණයට තිබුණු වඩා පුළුල් බලපෑම පිළිබඳ නිරීක්ෂණයක්.

**ix.** ආසියානු සංවර්ධන බැංකුවේ හා අනෙකුත් සමාන ආයතනයන්ගේ අත්දැකීම්වලට අනුව පැමිණිලිකරුවන් හා/හෝ අහිතකර බලපෑම්වලට පාත්‍ර වූ ජන කොටස් විසින් ලබා ගන්නා ලද ප්‍රතිලාභ ප්‍රමාණය පිළිබඳ විමර්ශනය හා විස්තර කථන.

**x.** ආසියානු සංවර්ධන බැංකුවේ වගකීම් දැරීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම සඳහා වැදගත් යයි දකින්නාවූ අනෙකුත් කරුණු.

**6.** ප්‍රතිපත්ති, වගකීම් දැරීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය, සහ එහි මෙහෙයුම් හා පරිපාලන පටිපාටි යන ඒවායේ වෙනස් කිරීම් හා වැඩි දියුණු කිරීම් සඳහා ඉහත විශ්ලේෂණය මත පදනම් වූ නිර්දේශ.

| **1 කොටුව. වගකීම් දැරීමේ යාන්ත්‍රණයේ සමාලෝචන හා විචාරණ කාල රේඛාව** |
| --- |
| **1 අදියර වත්මන් වගකීම් දැරීමේ යාන්ත්‍රණ ප්‍රතිපත්තිය (වෙබ් පදනම් වූ) පිළිබඳ අදහස් දැක්වීමට මහ ජනයාට ආරාධනා කරනු ලැබීම: [2010 ජූනි - සැප්තැම්බර්]**<br>ආසියානු සංවර්ධන බැංකුව එහි වත්මන් වගකීම් දැරීමේ යාන්ත්‍රණ ප්‍රතිපත්තිය පිළිබඳව අදහස් දැක්වීමට අරාධනා කරයි. 1 වන අදියර 2010 ජූනි සිට සැප්තැම්බර් දක්වා සති 12 ක් පැවැත් වේ. ලැබෙන අදහස් හා විවේචන පළමුවන සංශෝධිත ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීමේ දී සලකා බලනු ඇත. |
| **2 අදියර රටාභ්‍යන්තර හා අනතර්වාර විචාරණ: [2010- සැප්තැම්බර් නොවැම්බර්]**<br>ආසියානු සංවර්ධන බැංකුව සංවර්ධනය වන හා සංවර්ධිත සාමාජික රටවල් හයක රටාභ්‍යන්තර විචාරණ පවත්වනු ඇත. යෝජිත ස්ථාන වනුයේ කොළඹ, ෆ්‍රැන්ක්ෆර්ට්, ජකර්තා, මැනිලා, ටෝකියෝ හා වොෂිංටන් ඩීසී ය. විචාරණය ආණ්ඩු නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන, ව්‍යාපෘති මගින් පීඩාවට පත් ජන කොටස්, ව්‍යාපෘති ප්‍රතිලාභීන්, පෞද්ගලික අංශය, සංවර්ධන ඒජන්සි ආයතන සහ පොදුවේ ජනතාව ඇතුළු උනන්දුවක් දක්වන හවුල්කරුවන් පුළුල් පරාසයක් ඇතුළත් කර ගනු ඇත. එසේ ම ආසියානු සංවර්ධන බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය හා කාර්ය මණ්ඩලය ඇතුළු අභ්‍යන්තර හවුල්කරුවන් සමග ද අදහස් හුවමාරු කරගනු ඇත. |
| **3 අදියර පළමුවන සංශෝධිත ප්‍රතිපත්ති කෙටුම්පත (වෙබ් පදනම් වූ) පිළිබඳව අදහස් දැක්වීමට මහ ජනයාට ආරාධනා කරනු ලැබීම: [2010 දෙසැම්බර්]**<br>අදියර 1 හා 2 තුළ එකතු කර ගන්නා ලද ප්‍රතිපෝෂණ සංශෝධිත ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීමේ දී සලකා බලනු ඇත. සංශෝධිත ප්‍රතිපත්ති කෙටුම්පත සති 8 ක කාලයක් ආසියානු සංවර්ධන බැංකුවේ වෙබ් අඩවියේ පළ කරනු ඇත. |

## විචාරණ සැලැස්ම

ආසියානු සංවර්ධන බැංකුව එහි වගකීම් දැරීමේ යාන්ත්‍රණ ප්‍රතිපත්තිය සමාලෝචනය සම්බන්ධයෙන් සහභාගිත්ව හා පාරදෘශ්‍ය විචාරණ ක්‍රියාවලියකට කැපවී සිටී. ක්‍රියාවලිය ආණ්ඩු නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන, ව්‍යාපෘති මගින් පීඩාවට පත් ජන කොටස්, ව්‍යාපෘති ප්‍රතිලාභීන්, පෞද්ගලික අංශය, සංවර්ධන ඒජන්සි ආයතන සහ පොදුවේ ජනතාව ඇතුළු උනන්දුවක් දක්වන හවුල්කරුවන් පුළුල් පරාසයක් ඇතුළත් කර ගනු ඇත.

විචාරණයන්හි පරමාර්ථය වනුයේ උනන්දුවක් ඇති සියලුම හවුල්කරුවන්ට වගකීම් දැරීමේ යාන්ත්‍රණයේ සඵලදායකත්වය වැඩි දියුණු කිරීමට ආධාර කිරීමේ අවස්ථාවක් ලබා දීම හා එමගින් ආසියානු සංවර්ධන බැංකුවේ සංවර්ධන ප්‍රතිඵල වැඩි දියුණු කිරීමත් ය.

විචාරණයන්ට අදියර තුනක් තිබෙනු ඇත (1 කොටුව). පළමුවන අදියරේ දී ආසියානු සංවර්ධන බැංකුව එහි වෙබ් අඩවිය හරහා වත්මන් වගකීම් දැරීමේ යාන්ත්‍රණය පිළිබඳ මහජන අදහස් ලබා දීමට ආරාධනා කෙරේ. දෙවන අදියරේ දී සංවර්ධිත හා සංවර්ධනය වන යන දෙවර්ගයේ ම සාමාජික රටවල රටාභ්‍යන්තර විචාරණයන් පවත් වනු ලැබේ (2 කොටුව). තුන්වන අදියරේ දී ආසියානු සංවර්ධන බැංකුව එහි වෙබ් අඩවිය හරහා වගකීම් දැරීමේ යාන්ත්‍රණය පිළිබඳ සංශෝධිත කෙටුම්පත සම්බන්ධ මහජන අදහස්වලට ආරාධනා කෙරේ. වගකීම දැරීමේ යාන්ත්‍රණය සමාලෝචනය සඳහා වෙන් වූ වෙබ් අඩවියක් ස්ථාපනය කර තිබේ.

ලැබෙන ප්‍රධාන අදස් හා විවේචන ආසියානු සංවර්ධන බැංකු වෙබ් අඩවියෙහි පල කෙරෙනු ඇත.

| 2 කොටුව: 2010 වගකීම් දැරීමේ යාන්ත්‍රණ සමාලෝචන විචාරණයේ ස්ථාන හා දින | |
| --- | --- |
| **ස්ථාන** | **දින** |
| කොළඹ | සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 01 දක්වා |
| ටෝකියෝ | ඔක්තෝබර් 28 - 29 |
| වොෂිංටන් ඩීසී | නොවැම්බර් 2 - 4 |
| ෆ්‍රැන්ක්ෆර්ට් | නොවැම්බර් 8 - 9 |
| ජකර්තා | නොවැම්බර් 11 - 13 |
| මැනිලා | නොවැම්බර් 15 - 16 |

## ඔබේ අදහස් අපගේ අවධානයට ඇවසි කාරණයකි

ආසියානු සංවර්ධන බැංකුව එහි වත්මන් වගකීම් දැරීමේ යාන්ත්‍රණ ප්‍රතිපත්තිය පිළිබඳ ඔබගේ අදහස් ද එය දියුණු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව ඔබගේ යෝජනා ද ලබා දීමට ඔබට ආරාධනා කරයි. ප්‍රතිපත්ති සමාලෝචනය පිළිබඳ වාර්තාවක් සකස් කිරීමේ දී ඔබේ අදහස් පරිස්සමින් සලකා බලනු ඇත. අපි ඔබගෙන් ප්‍රතිචාරයක් අපේක්ෂාවෙන් සිටිමු.

අදහස් ඉදිරිපත් කිරීමට කරුණාකර **amreview@adb.org** ලිපිනයනට විද්‍යුත් තැපැලක් එවන්න.

## වැඩිමනත් දැන ගැනීමට

වගකීම් දැරීමේ යාන්ත්‍රණයේ සමාලෝචනය සඳහා වෙන් වූ වෙබ් පිටුවක් **www.adb.org/AM-Review/default.asp** හි ඇතුළත් කර තිබේ.